මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவி செயலாளர்<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/15-18/ TO/<br>A.T.R.-2023 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2022-12- 28 |

ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, සභා ලේකම්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

**<u>මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි/ සංවර්ධන නිලධාරි/ තාක්ෂණ සේවා නිලධාරී සේවයේ නිලධාරින් සඳහා වාර්ෂික ස්ථාන මාරු - 2023</u>**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ **කළමනාකරණ සේවා නිලධාරි, සංවර්ධන නිලධාරි සහ තාක්ෂණ සේවා නිලධාරි** සේවාවන්ට අදාළ 2023 වසරේ වාර්ෂික ස්ථාන මාරුවීම් **2023.03.01** දින සිට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමට මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇත.

02. අපගේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති ඉහත සේවාවන්ට අදාළ නිලධාරින්ගේ 2023 වසරේ වාර්ෂික ස්ථාන මාරු නියෝග සහිත ලේඛනය <u>භාගත කරගන්නා</u> ලෙස මෙයින් දන්වන අතර ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සේවය කරන **ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන් නව සේවා ස්ථානයේ 2023.03.01 දින රාජකාරී භාර ගැනීමට හැකිවන පරිදි මුදාහැරිය යුතු බවද** කාරුණිකව දන්වමි.

03. එසේම, **2019,2020 හා 2022 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබ මේ දක්වා සේවා ස්ථාන වෙත මුදා හැර නොමැති කළමනාකරණ සේවා නිලධාරි හා සංවර්ධන නිලධාරින් සිටී නම්** ඒ පිළිබඳ තොරතුරු ඇමුණුම 01හි සඳහන් ආකෘතිය අනුව සම්පූර්ණ කර 2023.01.16 දිනට පෙර මෙම කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙසත් වැඩිදුරටත් දැනුම් දෙමි.

04. තවද, වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව ඔබ කාර්යාලය යටතේ ඇති උප කාර්යාල සහ වෙනත් සේවා ස්ථාන වෙත අනුයුක්ත කර ඇති සියළුම නිලධාරින් ද දැනුවත් කරන ලෙස සහ ඒ පිළිබඳ අභියාචනා ඇත්නම් අපගේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති පහත සඳහන් **අභියාචනා ඉදිරිපත් කිරීමේ අයැදුම්පතේ** ආකෘතිපත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර, <u>ආයතන ප්‍රධානියා මගින්</u> **2023.01.16** දිනට හෝ එදිනට පෙර මෙම කොමිෂන් සභාව වෙත එවිය යුතු බවද වැඩිදුරටත් සඳහන් කරමි.

| | |
|---|---|
| ම.ප./වා.ස්.මා./DO-04 | මධ්‍යම පළාත් **සංවර්ධන නිලධාරි** සේවයේ යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව <u>අභියාචනා ඉදිරිපත් කිරීමේ අයැදුම්පත</u> |
| ම.ප./වා.ස්.මා./MSO-04 | මධ්‍යම පළාත් **කළමනාකරණ සේවා නිලධාරි** සේවයේ යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව <u>අභියාචනා ඉදිරිපත් කිරීමේ අයැදුම්පත</u> |
| ම.ප./වා.ස්.මා./TO-04 | මධ්‍යම පළාත් **තාක්ෂණ සේවා නිලධාරි** සේවයේ යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව <u>අභියාචනා ඉදිරිපත් කිරීමේ අයැදුම්පත</u> |

අ.පිට බලන්න

05. අභියාචනා තීරණයන්ට පසු අවසන් ස්ථාන මාරු නියෝග අනුව **2023.03.01** දින සිට ස්ථාන මාරුවීම් **ක්‍රියාත්මක සියළුම නිලධාරීන්** **2023.02.28** **දින සේවයෙන් පසු අනිවාර්යයෙන් මුදාහැරිය යුතු** බව මෙයින් කාරුණිකව දන්වමි.

මෙම කොමිෂන් සභාවේ නියමය පරිදි,

වී.ඒ.ඩී.ඩබ්ලිව්. දයානන්ද,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත.

පිටපත :
1. විගණකාධිපති - අ.ක.ස.

**ඇමුණුම 01**

# 2019, 2020, 2022 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබ මේ දක්වා නව සේවා ස්ථාන වෙත මුදා හැර නොමැති නිලධාරීන් පිළිබඳ උපලේඛනය

අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව :- ....................................................................................................................
ප්‍රාදේශීය කාර්යාලය :- ....................................................................................................................
සේවය :- ....................................................................................................................

- අදාළ සේවා ස්ථානයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබ මේ දක්වා නව සේවා ස්ථාන වෙත මුදා හැර නොමැති සියළුම නිලධාරින්ගේ විස්තර මෙහි අනිවාර්යෙන් ඇතුළත් විය යුතු බව සළකන්න.

| අනු අංකය | නිලධරයාගේ නම: මයා /මිය/මෙය/ යන්න සඳහන් කරන්න | ශ්‍රේණිය | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය ( --------- දින සිට ------ දින දක්වා) | වාර්ෂික ස්ථාන මාරු අදාළ වර්ෂය | ස්ථාන මාරු ලබා දී ඇති නව සේවා ස්ථානය | නව සේවා ස්ථානය වෙත මුදා හැර නොමැති වීමට හේතුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

(අ) මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ /කාර්යාලයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබ මේ දක්වා සේවා ස්ථාන වෙත මුදා හැර නොමැති සියළුම නිලධාරින් පිළිබඳ විස්තර මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බවත් සියලුම තොරතුරු නිවැරදි බවට සෑහීමට පත්වීමෙන් අනතුරුව සහතික කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම් සම්බන්ධයෙන් අදාළ විනය නිලධාරියාට වාර්තා කිරීම සිදුවිය හැකි බව සැළකිල්ලට ගනිමින් සහතික කරමි.

සකස් කළේ :- නම ........................................................................ අත්සන : ................................................ දුරකථන අංකය : ............................

පරීක්ෂා කළේ :- නම ........................................................................ අත්සන : ................................................ දුරකථන අංකය : ............................

දිනය :- ..............................

.....................................................................................
ආයතන ප්‍රධානියාගේ /දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

**සැළකිය යුතුයි -**

- සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතුය.
- තවද සාවද්‍ය තොරතුරු සපයා ඇති බව හෙළිදරව් වුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන ලද නිලධාරීන් වගකීමට බැඳී සිටින අතර ඔවුන් විනයානුකුල කටයුතුවලට ද යටත් වේ.